# තේක්ක වැවිල්ලෙන් ළූණු වගාවට



අපටත් උතුරේ අය වගේ වැඩ කරන්න බැරි නැහැ

ගමේ ඉඳලා ජීවිතේ ගැට ගහ ගන්න අමාරු නිසා මහට බැස්ස තනිකඩ ඉලන්දරියෙක්. අවිස්සාවේල්ලෙන් පටන් ගත් ගමන කෙළවර වුනේ පළූගස්වැවින්. රජරටදී ගොවිතැන මිසක් වෙන මොනව ද කරන්නේ. ඒත් ආරොන් අයියට සිද්ද වුනේ තේක්ක වවන්න. ලී මුදලාලි කැලේ ලී කපා ගන්නවා. ආරොන් අයියා හිස් ඉඩමේ තේක්ක හිටවන ගමන් හේන් ගොවිතැන් කරනවා. අවුරුදු ගණනක් ඒක කළත් වගතුවක් වෙන්නේ නැති බව තේරිලා ආයේ මහට බහින්නයි අදහස් කළේ.

තනිකඩ කාලේ හිතුවට ගමන පටන් ගත්තත් දූන් දරු පවුල් කාරණයක් නිසා මේ ගැන තනි තීරණයක් ගන්න බැරිව පළාතේ කෘෂිකර්ම උපදේශක මහත්තයා හොයන් ගිහින්. පියදස මහත්තයා ආරොන් අයියාගේ කතාවේ තවත් විස්තර ටිකක් කිව්වා.

මිනිහා බොහොම බලාපොරොත්තු කඩ වෙච්ච තත්ත්වයක හිටියේ. කර කියා ගන්න දෙයක් නැතිව. ඒ දවස්වල 1976 මෙහාට තදට පැවිල්ලත්. අපි මේ පැත්තේ සම්බන්ධිත ගොවි මහත්වරු පුහුණුවකට කිලිනොච්චි එක්ක යන්න ලෑස්ති කරලා තිබුණා. මිරිස්, රතුළූණු, වගා පිළිබඳව උතුරේ සහෝදර ගොවි මහත්වරුන් ගේ අත්දැකීම් හා උපදෙස් අපේ අයට දෙන්න. ආරොන් අයියා ආවේ අපේ ගමනට කලින් ද. මම එයාටත් එන්න කිව්වා. ගොවිතැන් කරපු කෙනෙක් ඉන් මඟහරවන එක පාඩුවක් නිසා. එයාගේ අළුත් ජීවිතේට මඟ පෑදුනේ මෙහෙමයි. හරිම අහම්බෙන් වාගේ.

**දෙරණ දිනුවෝ**

උතුරේ ගොවියන් ගන්න උත්සාහය දැක්කාම මට අළුත් හයියක් ආවා. අපිටත් ඒ වගේ කරන්න බැරිකමක් නැහැ නේද කියලා. ඒ දවස්වල අපටත් තිබුනේ වතුර ප්‍රශ්නය. මම ආඩියා ළිඳක් හදන හැටි හොඳට අහගත්තා. ආරොන් අයියා ගමනේ විස්තර කිව්වා.

මම පියදස මහත්තයා බලන්න ගියේ ජීවත් වෙන්න ක්‍රමයක් හොයලා දෙන්න කියන්නයි. කිලිනොච්චියේ ඉඳලා එද්දී මට හිතුණා මේක්ම කරක් ගහන එක තමයි මගේ

උරුමේ කියලා. ඇවිත් මේ ඉඩම වැට බැඳ ගත්තා. ආණ්ඩුවේ ඉඩමක්. අක්කර හත රක් විතර. ඊට පස්සේ මේ ලිඳ හාරා ගත්තා. අඩි විස්සක් විතර ගැඹුර යි. මුලින් මිරිස් ටිකකුයි, පතෝල මැස්සකුයි දැම්මා. මිරිස් මුල් සැරේ සරු වුනේ නැහැ. පතෝල මැස්ස නම් හරි ගියා.

### වාර්තා පොත

ආදායම ගැන විස්තර ටිකක් කියන්න පුළු වන් ද?

ආරොන් අයියා නැගිටලා ගිහින් පොතක් ගෙනාවා. මේකත් අපි අළුතින් පුරුදු වුන දෙයක්. ඉස්සර අපි ඒ ඒ වෙලාවට ඕනේ වියදම් කරනවා. ගණනක් මිම්මක් නැහැ. අතේ තිබ්බ සල්ලි ගියේ කොහාට ද කියලා දැන ගන්න විදිහක් නැහැ. දැන් කරන වියදම්



මේ සැරේ කරිවිලත් සරුවට හැදුණා

සේරම මේ පොතේ ලියනවා. එක් එක් බෝග ගැන. පොර, අළවළු ඇට, තෙල්, බෙහෙත්, තේ වතුරට, කුලී ගිය තරම්. ඒ වගේම ආදායම් ලැබුණු හැටි.

පතෝල වැල් 350 ක් තිබුණා. මුලින් ම රාත්තලක් ශත 35 ගණනේ වික්කේ. පස්සේ ශත 70 ටත් දුන්නා. පතෝල වලින් රු. 3,500 ක් හරියට ම ලැබුණා. මිරිස් පැල 200 යි. ආදායම රු. 67.45 යි. ඒ හැත්තෑ හතේ යල. මහ කන්නයේ රු. 400/-යි. ගෝවා ඇට ටින් අවුන්සයකින් පාත්ති දැම්මා. ගෝවා වලින් රු. 1,000 ක් ගත්තා.

**සීතාවකින් ඇරඹුණ ගමන ඉවර වුනේ පලගස් වැවින්. - ගොවි මහතුන්ගේ උනන්දුවයි කෘෂි කර්ම ව්‍යාප්ති සේවයයි එක්වුන හම ගොවිතැන නංවන එක මහ කාරියක් නොවෙයිනේද?.**

'වාර්තා පොත' බොහොම ප්‍රයෝජනයි. ගොවිපල, ගොවිතැන ගැන සේරම විස්තර මේකට අඩංගු යි. අපි අපේ ගොවි මහත්-වරුන්ට මේ වගේ වාර්තා පොතක් තියා ගන්න හැටි කියලා දෙනවා දැන්.

ආයේ පතෝල මැස්සක් දැම්මේ නැද්ද අපි ඇහුවා.

නෑ. මම ඉඩමේ එක් එක් තැන්වල එක එක ජාති හිටවව්වා. පතෝල මැස්ස ළිඳ කිට්ටුවයි තිබුණේ. වතුර දමන්න ලේසි නේ. එතැනම ආයේ පතෝල දැම්මොත් හරි නැහැනේ. පියදස මහත්තයා අපිට බෝග මාරුව ගැන කියලා දුන්නා. ඉතින් ඒ අනුව එක බෝගය දෙසැරයක් එක දිගට එකම පාත්තියේ හිටවන්නේ නැහැ. ඒකේ ලොකු ගුණයක් තියෙනවා.

### සම්බන්ධිත ගොවි

දැන් මේ මිරිස් පේළි අතරේ කව්පි හිටවලා. එතකොට පසට හෙවන වෙලා පස රැකෙනවා. අනික නයිට්‍රජන් එහෙම ලැබෙනවා නේද මහත්තයා. ආරොන් අයියා වැඩිදුරටත් කිව්වේ උපදේශක මහත්තයා දිහා බලමින්.


ආරොන් අය්යා අළවළු වගාව පිළිබඳ **'සම්බන්ධිත ගොවියෙක්'** කිව්වා නේද? කොහොම ද ඔච්චර ඉක්මනට එහෙම තේරු නේ?.

**'මේකයි' පියදස මහත්තයා අපට හරස් කැපුවා. මෙයා ළඟදී අළවළු ගොවිතැනට බැස්සට ක්‍රමානුකූලව උපදෙස් අනුව වැඩ කරන කෙනෙක් බව අපිට වැටහුණා. ඇත්තට ම මේ ජේන මේ පැත්තේ හොඳ ම අළවළු කොටුවක්. වාර්තා පොත් තියා**

**ගැනීම, බෙහෙත්, පෝර දැමීම වගේ දේවල් ආදිය උපදෙස්වලට අනුව ම කරනවා. ඒ නිසා ආරොන් අයියාත් අපි සම්බන්ධිත ගොවියෙක් හැටියට තෝරා ගත්තා. දැන් මෙයා ගෙන් උපදෙස් ගන්න 'අනුගාමික ගොවියන්' දෙළොස් දෙනෙක් ඉන්නවා.**

වතුර පොම්පයකුත් තියෙන්නේ. ආරොන් අයියාට සරු වෙලා වාගෙයි?

සරු වෙච්ච හින්ද ම නොවෙයි. ඕකත් මිනිහගේ මහන්සියේ ප්‍රතිඵලයක් තමයි.



ආඩියා ළිඳෙන් වතුර ගනිද්දී

ආරොන් අයිය ම විස්තරය කියන්නකෝ. පියදස මහත්තයා කිව්වා.

ගිය කන්නයේ මෙහාට තද පැවිල්ල. හබරණ ඉඳලා අනුරාධපුරේට යනකම් පාර දෙපැත්ත ද අළුවෙච්ච හේනක් වාගෙයි. කොතනක වත් වගාවක් හරියට කෙරුනේ නැහැ. ඒත් මම යි පවුලයි වතුර ඇදලා ඇදලා කොහොම හරි අපේ පැල නග්ග ගත්තා.

දවසක් මහත්තයෙක් කොටුවට ආවා. මුන්නැහේගේ ඉඩමේ විතරයි නිල්ලක් තියෙන්නේ. කොහොමද ළඟ වතුර පාරක්වත් තියෙනවා ද කියලා ඇහුවා.

මොන වතුර පාරක් ද මහත්තයා කියලා මම ආඩියා ළිඳ පෙන්නුවා. වත්තේ හැම තැනට ම වතුර අදින්නම වෙලාව ඉවර ඇති නේ. පොම්පයක් ගත්තොත් නරක ද?

### මහජන බැංකු උදව්

අපිට කොයින් ද ඕච්චර සල්ලි කිව්වා ම, සල්ලි ඕන නැහැ. අපි ලියුමක් එවන්නම්. ඒක අරන් කැකිරාවේ මහජන බැංකුවට එන්න කියලා මහත්තයා ගියා.

පස්සෙයි මම දැනගත්තේ ඒ අනුරාධපුර බැංකුවේ ලොකු මහත්තයා කියලා. කිව්වත් වාගේ ලියුම ආවා. කැකිරාවට ගියාම පොම්පය දුන්නා. මාස තුනකට සැරයක් රු. 350.00 බැගින් ගෙවන්න ඕන. පොම්පය රු. 3,278.00 ක් වෙනවා. මාගේ කාලය හුඟක් ඉතිරි කර ගන්න පුළුවන්, මේක නිසා.

මෙච්චර කල් ගත්ත ආදයම වත්තට ම ගියා. තවම අවුරුදු දෙකකට වැඩිය නැහැ නේ. ඉතිරියක් කරන්න දෙයක් තිබුනේ නැහැ. දැන් පොඩි ඇයොත් පස් දෙනෙක්. හිම්හිට ගේ පැලක් හදන්න ඕන. හැමදම මේ පැලේ ඉන්න බැනේ.

වී ගොවිතැන් කරන්න අදහසක් නැද්ද? අපි ඇහුවා.

දෙකක් කරන්න අමාරුයි. මේ ඉඩමට දැන් තාවකාලිකව බල පත්‍රයක් තියෙනවා. වෙල්වලට ඈත යන්න ඕන. දෙකක් රකින්න බැහැ. මේක හරියට කර ගත්තාම ඇති.

ඉස්සර මම උදේ හයට විතර ගිහින් රෑ නවයට විතර එන්නේ. තේක්ක හිටවන්න ගියාම. දැන් දෙයියනේ කියලා, තමන් ගේ ම එකේ දරු පවුලක් එක්කම ඉන්නවා නේ. මුන්නැහේ නොහිටින්න මම දරු පවුලත් කර පින්නාන් කොහේ යනව ද දන්නේ නැහැ. මගේ උරුමේ රජරටම තමයි. ආරොන් අයියා කිව්වේ පියදස මහතා දිහා කුළුණුබර සිනහවක් පාමිනුයි.